චක්‍රලේඛ අංක : 05/2022

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 , ජනජය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර , රාජගිරිය.
2022.03. 31

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත.

<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 ට සමගාමීව සමූපකාර සේවකයින් සඳහා මාසික දීමනාවක් ගෙවීම.</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2022 යටතේ රාජ්‍ය සේවකයින්ට ලබා දුන් රු: 5000/= ක මාසික දීමනාවට සමගාමීව බස්නාහිර පලාත් සමූපකාර සේවකයන් වෙත ද මාසික දීමනාවක් ගෙවීම කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමු විය.

02. ඒ අනුව සමූපකාර සමිති , පහත ක්‍රමවේද 03 න් අධ්‍යක්ෂ මණ්ඩලය/කාරක සභාව තීරණය කරනු ලබන එක් ක්‍රමවේදයක් පමණක් අනුගමනය කරමින් අවමය රු 2000/= සිට උපරිමය රු 5000/= දක්වා වන මාසික දීමනාවක් සමිතියේ සියළුම සේවකයන්ට එක සමාන ලෙස ලබා දීමට කටයුතු කල යුතුය.

- i සම්පූර්ණ දීමනාව මුදලින් ගෙවීම
- Ii සම්පූර්ණ දීමනාව පාරිභෝගික භාණ්ඩ වලින් ගෙවීම
- iii පාරිභෝගික භාණ්ඩ වලින් 50% ක් හා මුදලින් 50% ක් වන පරිදි ගෙවීම

03. මෙම දීමනාව, 2022.01.01 දින සිට ගෙවීමට කටයුතු කළ යුතු වන අතර එසේ ගෙවීමට අපහසු වන සමිති අවම වශයෙන් 2022.04.01 දින සිට වත් ගෙවීමට අවශ්‍ය පියවර ගත යුතුය.

04. මෙම දීමනාව ලබා ගැනීමට පිරිස්බල තක්සේරුවේ සඳහන් තනතුරක සේවය කරනු ලබන ස්ථිර,තාවකාලික හා කොන්ත්‍රාත් මෙන්ම දෛනික වැටුප් ලබන සේවකයන් සුදුසුකම් ලබයි.

05. වැටුප් රහිත නිවාඩු ලබා සිටින සේවකයන් හට මෙම මෙම දීමනාව සඳහා හිමිකමක් නොමැත.අඩ වැටුප් නිවාඩු ලබා සිටින සේවකයන් හට හිමිවනුයේ මෙම දීමනාවෙන් අඩකි.

06. දෛනික වැටුප් ලබන තැනැත්තන් සඳහා සේවයට වාර්තා කල යුතු සම්පූර්ණ දින ගණන ම සේවයට වාර්තා කර ඇත්නම් සම්පූර්ණ දීමනාව ගෙවිය යුතු අතර, එසේ සේවයට වාර්තා කර නොමැති නම් සේවයට වාර්තා කල දින ගණනට අනුපාතිකව දීමනාව ගෙවිය යුතුය.

07. ඉහත පරිදි දිමනා ගෙවීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හීදී , අදාල සමූපකාර සමිති විසින් සිය ආදායම් අනුව සුදුසු විකල්ප ක්‍රියාමාර්ගයකින් අදාල ප්‍රතිපාදන සපයා ගැනීමට කටයුතු කළ යුතුය.

08. මෙම දීමනාව විශ්‍රාම පාරිතෝෂිකය ගණනය කිරීමේදී , අදාල කර නොගත යුතු වන අතර , සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වීම සම්බන්ධයෙන් වන කල්හී, කම්කරු නීතිරීති අනුව කටයුතු කල යුතු වේ.

කොමිෂන් සභා නියමය පරිදි

එල්.පී. මනෝජා එස්. පතිරණ
ලේකම් (වැ.බ.)
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් : 1. ලේකම් පළාත් මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප.) - කා.දැ.ගැ.පි.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.